THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION

GMOA

ESTABLISHED IN 1926

TU No. 291

No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

2014/06/30

## මාධ්‍ය නිවේදනයයි

### හෙද සංගමය සහ ඔවුන්ගේ යෝජිත ස්වයං පාලනය

හෙද සංගමය හා එයට සම්බන්ධ හෙදියන් **රෝගී සත්කාරයට අනුගත නැත.** රෝගී සත්කාර උසස් කොට සලකන්නේ නම් ඔවුන් සූතිකාගාරය තුලදී මව ප්‍රසූත වේදනාවෙන් කෑගසද්දී එයට සහය දෙන වින්නඹු මාතාවට පහර දෙන්නේ නැත. හෙදියන්ගේ මෙම පිළිකුල් සහගත ක්‍රියා කලාපය කුරුණෑගල රෝහලේදී එම අවස්ථාවට මුහුණ පෑ මවගේ ප්‍රකාශයෙන් මැනවින් පැහැදිලි වේ.

> *“ මම අමාරු වෙලා කෑ ගහද්දී හැමෝම එළියට ගියා කිසි කෙනෙක් ලේබර් රූම් එකෙ හිටියේ නැහැ. මට දැනුනා දරුවා මගකට ඇවිත් හිර වෙනවා වගේ. මම හයියෙන් කෑ ගැහැව්වා එතකොට මිඩ් වයිෆ් කෙනෙක් කතුරක් අරන් දුවගෙන එනවා මම දැක්කා. එතකොටම නර්ස් කෙනෙක් ඇවිත් එයාට ගැහුවා. එයා වැටුනා. එයාට ගහනවා මම හොඳටම දැක්කා ” (උපුටා ගැනීම 2014/05/12 මව්බිම පුවත්පත)*

> *“ ඩොක්ටර්ස්ලා උත්සහය අත්හැරියේ නෑ. දෙවිවරු වගේ මට පිහිට වුනා. මම වේදනාවෙන් කෑ ගහද්දි මට ඇහුණා අම්මා බය වෙන්න එපා අපි ඉන්නවානේ කියලා ඩොක්ටර් කෙනෙක් කියනවා.” (උපුටා ගැනීම 2014/05/12 මව්බිම පුවත්පත)*

හෙදියන් සූතිකාගාරවල සහ මාතෘ ඒකක වල රෝග සත්කාරය මෙහෙයවන **වෛද්‍යවරුන්ට ද අවනත නැත.** එසේ අවනත නොවන නිසා මේ වන විට ඔවුන් සාමුහික වාට්ටු නිරීක්ෂණයෙන් හා වෛද්‍ය උපදෙස් පිලිපැදීමෙන් ඉවත් වී ඇත.

හෙද සංගමය, **ප්‍රසව හා නාරිවේද විශේෂඥයින් විද්‍යායතනයේ මතයටද ගරු කරන්නේද නැත.** ඒ නිසා ඔවුහු විශේෂඥ මතයට විරුද්ධව යමින් පලපුරුද්ද සපිරෙන්නට පෙර බලහත්කාරයෙන් පුහුණුව ලබන්නට උත්සාහ කරති. ඔවුන් සූතිකාගාර ගැටලුව විසඳීමට පත් කරන ලද විද්වත් කමිටුවේ වාර්තාවටද එකඟ නැත. හෙදියන් විසින් කමිටු වාර්තාව කුණු කූඩයට දමා මේ වන විට බොහෝකල්‍ය. හෙදියන් ආයතන සංග්‍රහය පිළිගන්නේද නැත. ඔවුන් සේවයට බැඳී ඇත්තේ ආයතන සංග්‍රහය සුරකින බවට පොරොන්දු වී බව ඔවුන් මේ වන විට අමතක කර ඇත. එහෙයින් ආයතන සංග්‍රහයේ පරිච්ජේද 28:1:3 යටතේ වින්නඹු මාතාවන්ටද ආයතන ප්‍රධානියා ලග සේවයට වාර්තා කිරීමට අයිතියක් ඇති බව ඔවුන් ප්‍රතික්ෂේප කරති. එසේම වින්නඹු සේවාවේ පැවැත්ම ඔවුනට තර්ජනයක් ලෙස හෙදියෝ සලකති. වින්නඹු මාතාවන්ට ඇති අධ්‍යාපනය ලැබීමේ අයිතියට හැකි හැමවිටම ඔවුහු අකුල් හෙලති.

මෙම තත්ත්වය තවදුරටත් වර්ධනය වී මෑතක සිට ස්වාමින්වහන්සේ විසින් ගරු මෛත්‍රීපාල සිරිසේන **සෞඛ්‍ය අමාත්‍යතුමාව නිර්ධය ලෙස විවේචනය** කිරීමට ආරම්භ කර ඇත. ඇමතිතුමාව පෞද්ලිකව හෙලා දැකීමට ස්වාමීන්වහන්සේ වීසින් කටයුතු කරති.

මේ අතරතුරදී ඔවුන් **රෝහල් පරිපාලනයද පිලිගන්නේ නැත**. මාතලේ සහ පේරාදෙණිය රෝහලේ පසුගිය දිනවල දිගහැරුනේ මෙම තත්ත්වයයි. ඔවුන්ගේ මීලග පියවර වී ඇත්තේ වෛද්‍ය පරිපාලනය ප්‍රතික්ෂේප කොට ස්වයං පාලනයක් ඉල්ලීමයි. රෝගියා මුල් කොට ඇති, වෛද්‍යවරයා විසින් ලබා දෙන උපදෙස් මත හෙද සේවාව රැඳී ඇති බව ඔවුහු පිලි නොගනිති.

ස්වයං පාලන ලබා දීමෙන් රටක පරිපාලනය බිඳ වැටෙන්නා සේම ස්වාමින්වහන්සේ විසින් යෝජිත මෙම **ස්වයං පාලනය** හරහා රෝගී සත්කාර සේවාව මුලුමනින්ම විනාශ වී යයි. වෛද්‍යවරයාගේ නායකත්වය පිලිනොගත් රෝගී සත්කාර සේවාවක් ලෝකයේ කිසිදු රටක නොපවතී. ඇත්නම් එය පවතින්නේ මානසික ව්‍යාකුලත්වයට පත්වූවකුගේ සිත තුල පමණී.

අද දින වන විට පේරාදෙණියේ හෙදියන් අනුව යමින් රාගම හෙදියන්ද තම සහෝදර වින්නඹු මාතාවන් 9 දෙනෙකු සූතිකාගාර තුනක් තුල රඳවාගෙන සිටිති. **මෙය ත්‍රස්තවාදී ක්‍රියාවකි.**

වෘත්තීය මතයන්ට ගරු නොකරන, පරිපාලන මූලධර්මයන්ට අවනත නොවන, රෝගීන්ට මෙන්ම මානුෂික ගුණාංග වලට ද එරෙහි මෙම ස්වාමින්වහන්සේ විසින් මෙහෙය වන හෙද සංගමයේ ස්වයං පාලන ඉල්ලීම කා සඳහාදැයි ජනතාව වටහා ගත යුතුය.

ස්තුතියි,

වෛද්‍ය ලසන්ත පිනදාස
ලේකම්

| | | | |
|---|---|---|---|
| වැඩිදුර විස්තර | - | වෛද්‍ය සමන්ත ආනන්ද | - 0777666301 |
| | | වෛද්‍ය හරිත අළුත්ගේ | - 0718121619 |
| | | වෛද්‍ය නලින්ද හේරත් | - 0717876516 |